# "මම බොහොම තෘප්තිමත් සේවයක් ඉටු කරනවා .... !"

*- අම්පාර මහ දිසාපති කියයි -*

**අම්පාර දිස්ත්‍රික්කයේ මහ දිසාපති වශයෙන් කටයුතු කරන්නේ සුනිල් කන්නන්ගර මැතිතුමාය. අපි "ගොවි ජනතා" සඟරාව වෙනුවෙන් 2008 අගෝස්තු මාසයේ ආරම්භයේ දිනක එතුමා මුණ ගැසුනෙමු. ඒ, එතුමාගේ කාර්යාලයේ දී ඉතා හදිසියෙනි. මෙහි සටහන් වන්නේ එදින එතුමා සමඟ අප කළ පිළිසඳර කතාවයි .....**



කලකට ඉහත අති දුෂ්කර ප්‍රදේශයක් ලෙස බොහෝ දෙනෙකුගේ කතාබහට ලක් වූ, ගල් ඔය ව්‍යාපාරය යටතේ දියුණු වෙමින් පැවති අම්පාර දිස්ත්‍රික්කය නැඟෙනහිර පළාතේ පිබිදෙන නගරය ලෙසින් හැඳින්වීම වඩාත් සුදුසු යැයි මට සිතේ. සෑම තැනකම කිසියම් සංවර්ධනමය කාර්යයක නියැළී සිටින මිනිසුන්ය. එපමණක් නොව, ඊට දායකත්වය සපයන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට අයත් යාන-වාහන මාර්ගයන් හි දෙපසට දිවෙයි. ඊට නො දෙවෙනි ව, විවිධ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්ට අයත් යන්ත්‍රෝපකරණ ඇතුළු විවිධ වූ උපාංග නෙත ගැටේ. වැලි, ගඩොල්, තාර වැනි ද සමඟ හරි හරියට ගැටෙමින් ගිණි අව්වේ කටයුතු කරන මිනිසුන්, කළු ගල් මෙන් ශක්තිමත්, ජවයෙන් නො දෙවෙනි සේනාවක් යැයි දකින අයෙකුට සිතෙනු නො අනුමානය.

මෙවන් මිනිසුන් පෙරටු කොටගෙන, ඔවුන්ට නායකත්වය සපයමින්, දිස්ත්‍රික්කයට නායකත්වය සපයන මහ ජව සම්පන්න මිනිසා සොයා ගෙන අපි ගියෙමු. ඒ යාන්තම් හිරු උද වී දෙ පැයක්වත් ගතවීමට මත්තෙනි. ඔහු ඒ වන විටත් ස්වකීය දෛනික රාජකාරී ආරම්භ කොට හමාරය.

'ආ .... ඊයෙත් ආව ලු නේද ... ?'

'මේ පොහොර සම්බන්ධ රැස්වීමක් තිබුණා, ඒක, ටිකක් දිගට ගියා .... '

අප දුටු විගස පැවසූ ඔහු, මහත් වූ කාරුණික ආරාධනයක් කළේය.

'හැබැයි, මට දන් මහඹය පැත්තේ රැස්වීමකුත් තියෙනව ...'

අපි ඔහුගේ වටිනා කාලයෙන් බිඳක් ඉල්ලා සිටියෙමු. එවිට ඔහු අපට ඊට අවකාශ සලසා දුන්නේය. මේ අපූරු ජව සම්පන්න මිනිසා අම්පාර **මහ දිසාපති සුනිල් කන්නන්ගර** මැතිතුමාය.

'කොහොම ද නැඟෙනහිර නවෝදය ...?'

අපි සංවාදයට අවතීරණ වෙමින් විමසුවෙමු.

'ඇත්තටම නැඟෙනහිර පළාත, විශේෂයෙන්ම මේ අම්පාර දිස්ත්‍රික්කය ගැන කතා කරන කොට මට මහ තෘප්තියක් දනෙනවා. දනට ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කෙරෙමින් විශාල වැඩ කොටසක් කෙරෙනවා. උදහරණයක් වශයෙන් කීවොත් සියඹලාන්ඩුව - කාර්තිව් මාර්ගය, සියඹලාන්ඩුව - අක්කරපත්තුව මාර්ගය, පොතුවිල් - පානම මාර්ගය ඇතුළු තවත් ග්‍රාමීය මාර්ග කි.මී. 400ක් වැඩි දියුණු කෙරෙමින් පවතිනවා. මේ සඳහා ප්‍රධාන වශයෙන් යුරෝපා සංගමයේ ආධාර ලැබී තිබෙනවා....'

මෙයට අමතරව ජපන් ජාත්‍යන්තර බැංකුව මඟින් තවත් ග්‍රාමීය මාර්ග 16 ක් සංවර්ධනය කරන්න ආධාර ලබා දෙනවා. මෙම මාර්ග වැටී ඇත්තේ අති දුෂ්කර ප්‍රදේශවල බව අවධාරණයෙන් සඳහන් කරන්නම ඕන. ඒ සමඟම **'ගම නැඟුම'** සහ **'මග නැඟුම'** වැඩසටහන් යටතේ ග්‍රාම

නිලධාරී කොට්ඨාසයන් හි මාර්ග වල කොන්ක්‍රීට් ඇතිරීම සිදු කරනු ලබනවා. සංවර්ධනයේ දී මෙය අත්‍යාවශ්‍ය කාරණයක්නේ....'

මෙහි දී, කෘෂිකාර්මික ප්‍රදේශයක් වශයෙන් අම්පාර ප්‍රදේශය සැලකීමේ දී හා එකී ක්ෂේත්‍රයට අයත් සංවර්ධනය වෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳව අපි විමසුවෙමු.

'වාරිමාර්ග ක්ෂේත්‍රයේ **'රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපාරය'** සඳහන් කරන්න පුළුවනි. තවත් වැව් දස දහසේ වැඩසටහන යටතේ කුඩා වැව් සංවර්ධන වැඩසටහන් ආරම්භ කොට තිබෙනවා. 'නෙකොඩ් ව්‍යාපෘතිය' මගින් කුඩා වැව් 39ක් වැඩි දියුණු කෙරෙමින් පවතිනවා...'

මෙහි දී, **'ගල්ඔය නවෝදය'** පිළිබඳව යමක් සඳහන් කරන්න මම කැමතියි. ගල්ඔය යෝජනා ක්‍රමයට අයත් ප්‍රදේශ පුනරුත්තාපනය කිරීමක් මෙහි දී සිදු කෙරෙනවා. ඒවගේම, පහත සඳහන් අංශ කිහිපයක් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙනවා. ඒ,

* කෘෂිකාර්මික සංවර්ධනය
* වාරිමාර්ග නඩත්තුව හා පුනරුත්තාපනය.
* සමාජීය යටිතල පහසුකම් ප්‍රවර්ධනය.
* කෘෂි ආශ්‍රිත කර්මාන්ත යනා දී යයි.

'අම්පාර දිසා බල ප්‍රදේශය තුළට විශේෂ අවධානය යොමු කරමින් මේ සංවර්ධන කටයුතු කෙරෙනවා...'

'එතකොට යුද්ධයෙන් විපතට පත් අය සඳහා 2007/2008 වර්ෂය සඳහා නිවාස 2,300ක් සහ 2008/2009 වර්ෂ සඳහා නිවාස 700කුත් සාද දීමට අපේක්ෂා කරනවා. මෙයට අමතරව ජීවණෝපාය සංවර්ධනය පැත්තෙන් නෙකෝඩ් ව්‍යාපෘතිය යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 15ක කටයුතු කෙරෙනවා. 'යළි පිබිදෙමු' නම් ව්‍යාපෘතිය මෙහි දී සඳහන් කළ යුතුයි...'

'ලෝක බැංකු ආධාර යටතේ තවත් ගම්මාන 25 ක ජීවණෝපාය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කෙරෙනවා. උතුරු-නැගෙනහිර වෙරළ තීරය පුරා සංවර්ධන ගම්මාන 115 ක ජීවණෝපාය සංවර්ධන වගේම යටිතල පහසුකම් සැකසීමේ කටයුතු කෙරී ගෙන යනවා...'

රජයක් මගින් එක් දිස්ත්‍රික්කයක් තුළ මෙතරම් කටයුතු/ක්‍රියාකාරකම් රැසක් එකවිට සංවිධානය කොට ඉටු කිරීමේ දී ප්‍රායෝගික ගැටළු ගණනාවක් පැන නඟී. එවන් ගැටළු අවම කොට ගන්නේ කෙසේ දැයි අපි විමසුවෙමු. විශේෂයෙන්ම, අම්පාර වැනි දුෂ්කර එමෙන්ම, සංකීර්ණ ජන සංයුතියක් පවතින දිස්ත්‍රික්කයක්වීම, අපේ පැනය විමසන්නට හේතු පාදක විය.

'අපට රාජ්‍ය අංශයේ නොයෙකුත් ආයතන සහ සංවිධානයන්ගේ ආධාර-උපකාර ලැබෙනවා වගේම රාජ්‍ය නොවන සංවිධාන හරහා යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වැනි ආයතන/ සංවිධානයන්ගේ ආධාර උපකාරයන් ලැබෙනවා. මෙම ව්‍යාපෘති බොහොමයක් ඍජුවම රජයට සම්බන්ධ වෙනවා...'

අපි අම්පාර ප්‍රදේශයට ළඟා වන විට මහ දෙපසට ඇදුන වාහන අතර විවිධ වූ රාජ්‍ය නොවන ජාත්‍යන්තර ආයතනයට අයත් වාහන ගණනාවක් දුටුවෙමු. අපි ඒ පිළිබඳ දිසාපතිතුමාගෙන් වැඩිදුරටත් කරුණු විමසුවෙමු.

"Oxfam" ආයතනය ගත්තොත් ක්ෂේත්‍ර ගණනාවක වැඩ කටයුතු කරනවා. කාබනික ගොවිතැන හඳුන්වාදීම, ප්‍රචලිත කිරීම, සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, සත්ත්ව නිෂ්පාදන කටයුතු සංවර්ධනය, බීජ නිෂ්පාදනය, බිත්තර වී නිෂ්පාදනය යනාදිය මෙහි දී සඳහන් කරන්න පුළුවනි...'

Red Cross - රතු කුරුස ආයතනයත් විවිධ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර දෙනවා. ඒ විතරක් නොවෙයි යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ලැබෙන සහාය අමතක නොකළ යුතු මට්ටමක පවතිනවා...'

ඉතින් මේ උදහරණ කිහිපයක් පමණයි. මේ ප්‍රදේශයේ Mercy Corps, Helvitas, Swiss Contact, Handicap International, ILO, UNDP, UN Habitat වැනි බොහෝ ජාත්‍යන්තර ආයතන ක්‍රියාත්මක වෙනවා. ඇත්තටම ඒ අයගෙන් මේ ප්‍රදේශය සංවර්ධනය සඳහා හොඳ දායකත්වයක් ලැබෙනවා...'

සාමාන්‍යයෙන් මෙම සියළු කටයුතු දෙස විමසා බැලීමේ දී ආසන්න වශයෙන් රුපියල් බිලියන 20කට වඩා වැඩි මූල්‍ය වටිනාකමකින් යුත් වැඩසටහන් ප්‍රදේශය පුරා ක්‍රියාතමක වේ. එය අපි දසින්ම දුටුවෙමු. තවදුරටත් නැගෙනහිර නවෝදයට වෙනත් අටුවා ටීකා අවශ්‍ය නොවන්නේ මෙවන් විශාල මුදල් කන්දරාවක වැඩකටයුතු සීඝ්‍රයෙන් ප්‍රදේශය පුරා ක්‍රියාත්මක වන නිසාවෙනි.

'ඉතිං ... අම්පාර ප්‍රදේශයේ **'අපි වවමු-රට නගමු'** වැඩසටහන කෙසේද...'යි අපි විමසුවෙමු.

**'අපි වවමු-රට නගමු'** කියන්නේ දැවැන්ත ජාතික වැඩසටහනක්. අනෙකුත් සංවර්ධන වැඩසටහන් මඟින් පවා **'අපි වවමු-රට නගමු'** වැඩසටහනේ අරමුණු පරයා යාමක් සිදු වන්නේ නෑ...'

'මේ ප්‍රදේශයේ ගෙවතු වගාව විශාල වශයෙන් ක්‍රියාත්මක වෙනවා. සෑම කෙනෙක්ම දායකත්වය ලබා දෙන්න පැකිලීමක් නැතිව ඉදිරිපත් වෙනවා. බොහොමයක් රාජ්‍ය නොවන සංවිධානයන් හි වැඩසටහන් මේ ආශ්‍රයෙන් සිදු වෙනවා...'

මෙම කතා බහ අතර අම්පාර මහ දිසාපති සුනිල් කන්නන්ගර මැතිතුමාගේ උපන් ගම සහ අනෙකුත් ජීවන තොරතරු දැන ගැනීමේ කුතුහලක් අප සිත් තුළ ඉපැදුණි. අපි ඒ බැව් ඒ මහතාට දන්වූයෙමු. එතුමාගේ මුහුණ ප්‍රබෝධයෙන් දිදුලන්නට විය. අනතුරුව එක් විටම ම'දෙස බලා සිනාසුණි.

'මගේ ගම් පළාත කිව්වොත් බදුරලිය ප්‍රදේශයේ බොරළුගොඩ කියන ගම් ප්‍රදේශයයි. ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා ගෙන ද්වීතියික අධ්‍යාපනය සඳහා පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයට ඇතුළු වුණා. ඊට පස්සේ වැඩිදුර අධ්‍යාපනය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඇතුල් වුණා. එහි දී සංවර්ධන අධ්‍යයනවේදී උපාධිය සම්පූර්ණ කළා. ඉන් අනතුරුව, පරිපාලන විභාගය සමත් වී පරිපාලන ක්ෂේත්‍රයට ඇතුළු වුණා...'

රාජ්‍ය අංශයේ විවිධ තනතුරු හොබවමින් ක්ෂේත්‍ර ගණනාවක සේවය කිරීමේ දුර්ලභ අවස්ථාව **සුනිල් කන්නන්ගර** මහතාට හිමි විය. කොළඹ, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සේවය කිරීම ඔහු සිහිපත් කරන්නේ තරමක අභිමානයකිනි. 1986 වර්ෂය වන විට ඔහු අම්පාර කච්චේරියේ උප දිසාපතිවරයෙකු වශයෙන් පත්වීම ලබන අතර මහඔය සහ අම්පාර ප්‍රාදේශීය ලේකම්වරයෙකු වශයෙන් සේවයට කැපවෙයි. මෙම කාල සීමාවේ දී කුඩා කර්මාන්ත, පේෂ කර්මාන්ත සහ ධීවර යනා දී ක්ෂේත්‍ර ගණනාවක සේවය කිරීමේ අවස්ථාව හිමි වෙයි.

'මහ ඔය ප්‍රාදේශීය ලේකම් වශයෙන් මම කිරි නිෂ්පාදකයන් වෙනුවෙන් සමූපකාර සමිතිය සමඟ වැඩසටහනක් ආරම්භ කළා. මෙහි කිරි එකතු කිරීම ආරම්භ වීමත් සමඟ කිරි ගොවීන් තුළ නැවුම් බලාපොරොත්තු ඇති වුණා. මුල්ම දවසේ කිරි ලීටර් 14 යි එකතු වුනේ. අපට එය කිරි ලීටර් 300-400 මට්ටමට ගෙන එන්න පුළුවන් වුණා. 1993 අවුරුද්දේ සුළුවෙන් පටන් ගත් එම ව්‍යාපෘතිය වර්තමානය වන විට පුළුල් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් දන් කාලේ කිරි ලීටර් 7,000ක් පමණ එකතු වෙන බව තමයි වාර්තා වෙන්නේ...'

අම්පාර මහ දිසාපතිතුමාගේ වත ප්‍රභාමත් ය. ඔහු මහත් වූ තෘප්තියකින් ස්වකීය අතීත සේවා කටයුතු මෙනෙහි කරයි. රාජකාරී කටයුත්තකට වඩා ඉන් ඔබ්බට ගිය සේවාවක් මෙහි ගැබ්ව ඇතැයි මට සිතේ. කෙසේ වෙතත්, විවිධ ජන කොටස් මෙන්ම නා නා විධ ආගමික ඇදහීම් අදහන ජන කොට්ඨාසයන් රැසක් වෙසෙන මෙම දිස්ත්‍රික්කයේ ජන සංයුතිය මෙන්ම සමාජ සංයුතිය ද සංකීර්ණය. මේ පිළිබඳව අපි එතුමාගෙන් විමසුවෙමු.

'බහු වාර්ගික මෙන්ම බහු ආගමික ජන කොට්ඨාසයක් මෙහි ජීවත් වෙනවා. එකම දිස්ත්‍රික්කය තුළ, ඔවුන්ට ආවේණික වූ කලාපයන් තුළ වෙන වෙනමයි මේ අය ජීවත් වෙන්නේ. එමනිසා, අන්තර් සංස්කෘතික අවබෝධය තරමක් දුරට අඩුයි. එකිනෙකා කෙරෙහි පවතින අනවබෝධය වැඩියි. මේ නිසා, මෙම ප්‍රදේශයේ බොහොම කල්පනාකාරීව වැඩ කටයුතු කළ යුතුයි. සැමටම සමානව සැළකිය යුතු වෙනවා. මෙම අනවබෝධය අඩු කිරීමට විවිධ වූ වැඩසටහන් දනට ක්‍රියාත්මක වෙනවා. **'අපි වවමු-රට නහමු' වැනි පොදු අරමුණක් වෙත මොවුන් සමීප කරවීම තුළින් මෙම පිරිසට සමානව සැලකීමට අපට පුළුවන් වෙලා තිබෙනවා.** විශේෂයෙන් අවධාරණය කළ යුතු කාරණයක් තිබෙනවා. අපි කොපමණ උත්සාහ ගත්තත් පිටස්තර ප්‍රදේශවලට වැරදි තොරතුරු යනව නම් අපට අපේ අරමුණ ඉටු කර ගන්න අපහසු වෙනවා. එමනිසා, මම කරුණාවෙන් හැම කෙනෙකුගෙන්ම ඉල්ලා සිටිනවා **මෙම පළාත් ගැන නොදන්නව නම් බොරු තොරතුරු පතුරවන්න එපා කියලා...'**

අම්පාර දිසාපති **සුනිල් කන්නන්ගර** මැතිතුමා සමඟ හෝරා ගණනාවක් වුව ද, කතා-බහ කළ හැකිය. එතුමා සමඟ සාකච්ඡාවේ යෙදී සිටින විට කාලය ගෙවී යනු නො දනෙයි. තව මොහොතකින් එතුමා මහ ඔය ප්‍රදේශයේ රැස්වීමක් සඳහා යා යුතුය. ඔහුගේ උපකාරය ලැබෙන තුරු අති දුෂ්කර ප්‍රදේශයක ජනතාවක් බලා සිටියි. ඉතිං අපි සමුගන්නට සිතුවෙමු. අවසාන වශයෙන් එතුමාගේ රාජකාරිය තෘප්තිමත් එකක් දැයි අපි විමසුවෙමු.

'මම බොහොම තෘප්තිමත් සේවයක් ඉටු කරනවා. මෙහෙ ජනතාව බොහොම හොඳයි. මට හැම පාර්ශවයකින්ම හොඳ සහයෝගයක් ලැබෙනවා. නිලධාරීන් උනන්දුයි. ඇත්තෙන්ම ඔවුන්ගේ කැපවීම තියනව නම් කරන්න බැරි දෙයක් නෑ කියල මට හිතෙනවා. සුළු අඩු-පාඩු අපට හද ගන්න පුළුවනි...'

'මේ ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර ගණනාවක නිලධාරීන්ගේ හිඟයක් තියනවා. සැලසුම්, ගිණුම් අංශ ඇතුළුව අනෙකුත් කාර්ය මණ්ඩල සඳහා නිලධාරීන් අවශ්‍යයි. විශේෂයෙන් කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය මානව සම්පත් පිළිබඳව මෙහි දී සඳහන් කරන්න ඕන...'

'අවසාන වශයෙන්, කිව යුතු කාරණයක් තිබෙනවා. අම්පාර දුෂ්කර ප්‍රදේශයක් කියනවට වඩා මම කැමතියි විශාල සංවර්ධනයක් සිදුවෙමින් පවතින ප්‍රදේශයක් ලෙස හඳුන්වන්න. ආසියාවේ තිබෙන හොඳම රෝහල පිහිටලා තිබෙන්නේත් අම්පාර දිස්ත්‍රික්කය තුළයි...'

'මෙම ප්‍රදේශවල සංචාරය කරන්න බය වෙන්න දෙයක් නෑ. කාටත් ඇවිත් සංචාරය කරන්න පුළුවනි. පුරා විද්‍යා වටිනාකම් වගේම සොබා සෞන්දර්යයෙන් පිරුණු ස්ථාන රැසක් මෙම දිස්ත්‍රික්කය පුරා තිබෙනවා.

'එන්න, ඇවිත් ඇවිදලා බලන්න.

මම ආරාධනා කරනවා ....'

සංවාද සටහන
**එස්.ඒ.සී.යූ. සේනානායක**
**විසිනි**